"පැන්ඩෝරා ප්‍රකෝටිපතියෝ 93 ක් ලංකාවේ" යනුවෙන් දිවයින පුවත්පතේ (10/10) මුල්පිටුවේ ප්‍රධාන පුවතෙහි සිරස්තලය යෙදී තිබිණි. මෙහි පුවත් අන්තර්ගතයේ සඳහන් වූයේ, ශ්‍රී ලාංකිකයින් 93 දෙනෙකු සතු විදේශ වත්කම් සහ කළු සල්ලි ආයෝජනයන් සම්බන්ධයෙන් ගවේෂණාත්මක මාධ්‍ය ජාලය මගින් හෙළි කළ පැන්ඩෝරා ලියකියවිලි වල සඳහන් වන බවයි.

ජාත්‍යන්තර ගවේෂණාත්මක මාධ්‍යවේදීන්ගේ සංවිධානයේ (ICIJ) OFFSHORE LEAKS දත්ත සමුදායේ දැක්වෙන ආකාරයට අනුව ශ්‍රී ලංකාව සෙවීම් කළ විට, "නිලධාරීන්" ලෙසින් 93 දෙනෙකුගේ නම් ලැයිස්තුවක් පැමිණේ. නමුත් මෙම ලැයිස්තුව අයත් වන්නේ පැනමා ලියැවිලි (Panama Papers), අක්වෙරළ ලියැවිලි (Offshore Leaks), පැරඩයිස් ලියැවිලි (ඇපල්බි) (Paradise Papers - Appleby), පැරඩයිස් ලියැවිලි (මෝල්ටා කෝපරේෂන් රෙජිස්ට්‍රි) (Paradise Papers - Malta corporate registry) යන හෙළිදරව් සියල්ලටම වේ.

ජාත්‍යන්තර ගවේෂණාත්මක මාධ්‍යවේදීන්ගේ සංවිධානයේ වෙබ් අඩවියේ පැන්ඩෝරා ලියැවිලි සම්බන්ධයෙන් පමණක් මෙසේ ශ්‍රී ලාංකිකයින් 93 දෙනෙකුගේ නම් සඳහන් වී තිබෙනු අපට සොයාගැනීමට නොහැකි විණි.

ඒ අනුව,

1) මෙම සියලුදෙනාම "පැන්ඩෝරා ප්‍රකෝටිපතියන්" ලෙසින් හැඳින්වීම ඔස්සේ, පාඨකයාට වැරදි තොරතුරු ලබාදීමක් සිදුවෙතැයි ඔබ සිතන්නේද?

2) මූලාශ්‍ර නිවැරදිව පරිශීලනය කළේ නම්, මෙවැනි දෝෂයන් වළක්වා ගැනීමට ඉඩ තිබුණේ යැයි ඔබ සිතන්නේද?

මූලාශ්‍ර:

Browse by country Sri Lanka | ICIJ Offshore Leaks Database

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina**